නිවාස,ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
வீடமைப்பு,நிர்மாணத்துறை மற்றும் கலாசார அலுவல்கள் அமைச்சு
Ministry of Housing, Construction and Cultural Affairs

ලෝක නාට්‍ය දිනය
உலக அரங்க தின
World Theatre Day

27 මාර්තු
மார்ச்
March

ජාත්‍යන්තර රංගකලා ආයතනය
சர்வதேச நாடக நிறுவனம்
International Theatre Institute

ටවර් හෝල් රඟහල පදනම
டவர்ஹோல் நாடக மன்றம்
Tower Hall Theatre Foundation

## කාර්ලොස් සෙල්ඩ්‍රන් , කියුබාව, 2019 ලෝක නාට්‍ය දින සංදේශය

රංග ලෝකයට මා අවදිවන්නට පෙර මගේ ගුරුවරු එහි සැපත්ව සිටියා. ඔවුන්ගේ ම ජීවිතවල ඉතුරු බිතුරු මත ඔවුන් ස්වකීය නිවාස මෙන්ම සෞන්දර්ය ප්‍රවේශයන් ගොඩ නගා තිබුණා. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් අඥාතයි - නැත්නම් , ඔවුන් ගැන මතකක් ඇත්නම් ඒ යාන්තමින් ; ඇත්තටම ඔවුන් වැඩ කළේ නිහඬව , ඔවුන්ගේ පුහුණු කාමරවල නිහතමානිත්වය තුළ , ප්‍රේක්ෂකයන් පිරුණු රංග ශාලා කෙළවරක . එහෙම , වසර ගණනාවක තිස්සේ නොකඩවා ශ්‍රමය වගුරුවමින් අද්විතීය ජයග්‍රහණත් හිමිකරගත්තා වුනත් , හෙමි හෙමින් ඒ ස්ථානවලින් බැස ගිහින් ඔවුන් අතුරුදන් වුණා. මගේ පුද්ගලික ඉරණම වන්නේ ඔවුන්ගේ පිය සටහන් ඔස්සේ ඉදිරියට ගමන් කිරීමයි කියා මට තේරුම් ගියාම , තව දෙයක් මට තේරුණා. මගේ උරුමය ගැන . පුනරාවර්තනය කළ නොහැකි අපූර්ව මොහොතක පාරදෘශ්‍යභාවය සාක්ෂාත් කරගනු විනා වෙනත් කිසිදු අපේක්ෂාවකින් තොරව වර්තමානයේ ජීවත්වීම - මගේ ජීවන ග්‍රහණය! ; වදනක හෝ අභිනයක සත්‍යයේ සවිය විනා වෙනත් කිසිදු ආරක්ෂාවකින් තොරව රංග ශාලාවේ අඳුරේ අනෙකා සම්මුඛ වීමේ මොහොත!

ඉදින් , මගේ පුරවරයේ වෙනස් වෙනස් මාවත් දිගේ , සන්ධ්‍යාවෙන් සන්ධ්‍යාවට අපේ රඟහල ට ඇදී අවුත් අප සමග මිනිත්තු කිහිපයක් , නොඑසේ නම් හෝරා කිහිපයක් බෙදාහදා ගන්නට එන ප්‍රේක්ෂකයා සම්මුඛවන අර නිමේෂයන් අතරයි මගේ රංගමය නිජබිම පැතිර ඇත්තේ . මම මම වීම අහෝසි වන , මා වෙනුවෙන් මා දුක් නොවන ඒ අපූර්ව නිමේෂයන් මතයි මගේ ජීවිතය ඉදිවන්නේ. ඒ භවය නිම වී නැවත මා ඉපදෙන මොහොතේ රංග වෘත්තීය යන්නේ අරුත් මට පසක් වෙනවා ; එය වෙන කිසිවක් නොවේ , හුදෙක්ම ක්ෂණභංගුර නිර්මල සත්‍යයේ නිමේෂයන් තුළ ජීවත් වීමයි; අපි දන්නවා , රංගාලෝකය යට අපි කියන කරණ හැමදෙයක්ම අපේ ජීවිතයේ වඩාත්ම පුද්ගලික , වඩාත්ම ගැඹුරු හා වඩාත්ම බැරෑරුම් ජීවන මානයන් පිළිබිඹු කරන්නා වූ ඇත්ත - යුත්ත බව . මගේත් මගේ නළුවන්ගේත් රංග දේශය වූ කලී එබඳු නිමේෂයන්ගෙන් සැදුම් ලත් ලෝකයක් ; අපේ වෙස්මුහුණු හා වාගාලංකාර පසෙක දමා , අපි ගැනම ඇති බියසංකා හැරදමා අඳුරේ අත්වැල් බැඳ ගන්නටයි අපි මේ ලෝකයට ඇතුල් වෙන්නේ .

රංග සම්ප්‍රදායය වැතිරෙන්නේ තිරස් අක්ෂයක් දිගේයි . ලෝකයේ කිසියම් කේන්ද්‍රයක , නැතහොත් නගරයක නොඑසේනම් කිසියම් වරප්‍රසාදිත ශාලාවක රංගය පවතින්නේ යැයි කියන්නට

කිසිවෙකුටත් බැහැ . මට එය උරුම වූ ආකාරයට , රංගය ව්‍යාප්ත වන්නේ රංගනයේ යෙදෙන්නන්ගේ ජීවිතය ද , රංග ශිල්පයද එකට කැටිකරගත් තනි සමෝධානික අභිනය ආශ්‍රිත අදෘශ්‍යමාන භූගෝලයක් ඔස්සේයි , පුනරුක්තියක් නොමැති ව්‍යක්තභාවයේ හා සුන්දරත්වයේ තමන්ගේම ඒ නිමේෂයන් සමග සියලු මහා රංගධරයෝ අභාවයට යනවා ; සත්කීර්තිමත් භාවයට හෝ ආරක්ෂාවට වෙනත් අතික්‍රමණ මාවතක් තමන් සතුව නොමැති ඔවුන් හැමදෙනාම මැකී යන්නේ එකම ආකාරයකටයි. අපගේ කාර්යයන්ගේ මූලය වශයෙන් පවතින ඉහත කී සුවිනිශ්චිතභාවයට මුහුණ දෙන විට කිසිදු හැඳිනුම් සාක්ෂියක් වලංගු වන්නේ නැහැ . රංග ගුරුවරු මේ බව හොඳින්ම දන්නවා . ඉදින් මේ කාර්යය නම් මහා අවිනිශ්චිතතාවක් මැද්දේ සත්‍යයේ , සංදිග්ධතාවේ සහ නිදහසේ නිමේෂයන් නිර්මාණය කිරීමයි . ඔවුන් කළ කී දේගැන හොඳටම සුදුමැලි ඡායාමාත්‍රයක් පමණක් හසු කරගත් වීඩියෝ පටයක , ඡායාරූපයක රැඳෙන දත්ත හා වාර්තා හැරෙන්නට කිසිවක්ම ඉතිරිවන්නේ නැහැ . එපමණක් නොවේ , ඒ වාර්තාවලට කිසිසේත්ම හසු වන්නේ නැහැ ඒ සිදුවන දෙය පිළිබඳව අවධානයෙන් සිටින ප්‍රේක්ෂකයා ගේ නිහඬ ප්‍රතිචාරය තුළ ගැබ්වන සත්‍යය. ඒ මොහොතේ, සමහර විට තත්පර කිහිපයක් තුළ ප්‍රේක්ෂකාගාරය විසින් බෙදාහදාගන්නාවූ සත්‍යයන් රැගත් ජීවනානුභූතීන් නම් ඉන් බැහැර සොයා ගන්නට බැහැ , පරිවර්තනය කරන්නටත් බැහැ , ඒවා විටෙක ජීවිතයට ත් වඩා විනිවිද පෙනෙන සුළුයි .

රංගය වනාහී තමා තුළම අඩංගු දේශයක් බව , මුළු ලෝකයම වසා සිටින්නාවූ භූමියක් බව මා වටහා ගන්නා විට අධිෂ්ඨානශීලී කම්පනයක් මා තුළ නැගී සිටියා , නිදහස සාක්ෂාත් වීමක්ද ඒ තුළ පිළිබිඹු වුනා; වැඩිදුරක් ඔබට යන්න වෙන්නෙ නැහැ , කොටින්ම ඉන්න තැනින් ඉවතට යන්න උවමනා කරන්නෙම නැහැ , දුවන්නවත් ඇවිදින්නවත් අවශ්‍ය නැහැ. ඔබ ඉන්නේ කොතන වුනත් එතන ප්‍රේක්ෂකයාත් ඉන්නවා . ඔබ දැලේ ඔබේ වෘත්තීක සගයින් ඉන්නවා . ඔබේ නිවසින් ඔබ්බේ , බැහැර , ඔබට ඕන තරම් පාරාන්ධ , සනාධික දෛනික යථාර්ථයක් තියෙනවා. ඉතින් , ඒ දෘෂ්‍යමාන නිර්ජංගම භාවය මත සිට ලෝකයේ මහා ම චාරිකාව සැලසුම් කරන්න පුළුවන් ; ඔව් ඔබට පුළුවන් ආගොනෞට් යාත්‍රිකයින්ගේ මහා ඔඩිසි චාරිකාව නැවත ආරම්භ කරන්න ; සැබෑ ලෝකයේ ඝනත්වය සහ දෘඪබව කපා ගෙනයන්න සූදානම් වන ඔබ නිශ්චල යාත්‍රිකයෙක්. ඔබගේ චාරිකාව අර ඔබේ සුහදයන් සමග සම්මුඛ වන නැවත පුනරුක්තියක් නොමැති මොහොත දෙසටයි එල්ලවී තිබෙන්නේ . ඔබේ චාරිකාව ඔවුන් වෙතටයි , ඔවුන්ගේ හදවත් වෙතටයි , ඔවුන්ගේ පුද්ගලත්වය වෙතටයි . ඔබ ඔවුන් තුළින් ගමන් කරනවා , ඔවුන්ගේ භාව ලෝකය හරහා , ඔබ විසින් අවදිකොට පණගන්වන ඔවුන්ගේ මතකයන් ඔස්සේ ඔබ යාත්‍රා කරනවා. ඔබේ චාරිකාව කරකැවිල්ලක් ඇතිකරන සුළුයි , කිසිවෙකුටත් එය මනින්න බැහැ , නිහඬ කරන්නත් බැහැ. ඇත්තටම කාටවත් ඒක හරියාකාරව අල්ලගන්නත් බැරිවෙයි , මන්ද කිව්වොත් එය ඔබේ ජනතාවගේ පරිකල්පනය හරහා සිදුවන පියාසැරියක් ,... ඈත දුරක පසට යට කළ බීජයක් ; ඒ පස නම් ඔබේ ප්‍රේක්ෂකයන්ගේ චර්යා ධාර්මික පුරවැසි මනස හෙවත් මානව හෘදයසාක්ෂියයි. මේ නිසා මම කොහිවත් අමුතුවෙන් යන්නේ නැහැ , දෘශ්‍යමාන නිශ්චලතාවය තුළ කිට්ටු සගයන් සමග දිවා රෑ මම වැඩ කරනවා , ඔබ ට පෙනෙනවා එහෙත් , ප්‍රවේගයේ රහස මා ළඟ තියෙනවා .

- කාර්ලොස් සෙල්ඩ්‍රන් -

පරිවර්තනය : ආචාර්ය සුනිල් විජේසිරිවර්ධන

Massage of the World Theatre Day 2019 Translated into Sinhala from English by Dr.Sunil Wijesiriwardane.